සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4 th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/SD/09/MV

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2015.11.18

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

<u>ආදර්ශ ගම්මාන වැඩසටහන - 2015</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් වු DDD/HO/07/SD/08/AP දරණ 2015.05.06 දිනැති ලිපිය සහ 2015.06.09 දිනැති ලිපි පිළිබඳ ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් ආදර්ශ ගම්මානය බැගින් මේ වන විට තෝරා ගෙන ඇති අතර එහි සංවර්ධන කටයුතු සඳහා ඔබගේ පූර්ණ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම අපේක්ෂා කරමි.

03. මෙසේ තෝරා ගෙන ඇති ආදර්ශ ගම්මාන අතරින් දිස්ත්‍රික්කයේඑක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් තෝරා ගෙන ඇති ගම්මානය බැගින් ගම්මාන 25ක් සඳහා ජාතික මට්ටමේ සෘජු අධීක්ෂණයටද යොමු කිරිමට අපේක්ෂා කර ඇත.

04.මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරින් ගේ වගකීම වන අතර ඒ සඳහා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඊට අදාල සම්පත් හා නිලධාරින්ද ඒකාබද්ධ වී මෙම ආදර්ශ ගම්මානය සංවර්ධනය කිරිමට සහය ලබා දෙන්නේ නම් මෙම කාර්ය ඉතාමත් පහසු වනු ඇත. එබැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලද මේ සඳහා අවශ්‍ය සියළු ආයතනික හා සියළු නිලධාරින්ගේ ඒකාබද්ධ ප්‍රවේශය ලබා ගැනිම අත්‍යවශ්‍ය වේ.

05. එමෙන්ම ආදර්ශ ගම්මානය ගොඩනැගිමට හා සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය සංකල්ප පත්‍රිකාව මේ සමග ඔබ වෙත එවන අතර ඒ අනුව ආදර්ශ ගම්මානයේ කාර්ය භාරය වසම් භාර දිවිනැගුම සංවර්ධන නිලධාරි වෙතපැවරීමටත් හා වසමේ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල අදාල නිලධාරීන්ගේ සහය මෙම වැඩසටහන වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව දැනුම් දෙමි. එමෙන්ම මෙම කාර්යයේ අධීක්ෂණය හා වගකීම සංකල්ප පත්‍රිකාවේ මෙහෙයුම් කමිටුවේ ඇති නිලධාරීන් වෙත පැවරීමටද අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ද වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මෙම වැඩසටහනට මේ වසරේ දී මුලික කටයුතු සඳහා රුපියල් 110,000/- ක් බැගින් වෙන් වන අතර එම මුදලින්

- ❖ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගෙන ඇති ආදර්ශ ගම්මානයට අදාලව

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General
011-2871672
011-2871672
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය / அலுவலகம் / Office
011-2887280
011- 2887722(Hotline)

i. සංවර්ධන නිලධාරින්, ක්ෂේත්‍ර සහකාර, සමාජ සංවර්ධන සහකාර, කලාප කලමණාකරු හා කලමණාකාර අධ්‍යක්ෂ දිස්ත්‍රික් කාර්යාලයට කැදවා ආදර්ශ ගම්මාන වැඩසටහන පිළිබද දැනුවත් කිරිම හා ඉදිරි සැලසුම් කිරිම.

ii. ජාතික මට්ටමින් මැදිහත්වීම සදහා මේ වන විටත් තෝරා ගෙන ඇති ආදර්ශ ගම්මානයේ ළමා, තරුණ, කාන්තා හා වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරිම හා සංවර්ධන කමිටු පිහිටුවීම

iii. විධිමත් මුලික සමීක්ෂණයක් සිදු කිරිම හා විධිමත් සංවර්ධන සැලසුම් සකස් කිරිම.

iv. සංවර්ධන සැලැස්මට අදාලව ගමට අවශ්‍ය මුලික අවශ්‍යතා ප්‍රමුඛතාවය අනුව ක්‍රියාත්මක කිරිම.

යන කරුණු සදහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන මෙන් කාරුණිකව ඉල්ලමි.



ධම්මික ගුණවර්ධන

අධ්‍යක්ෂ ජනරාල් ( වැ.බ.)

පිටපත -

01.සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් - කරු, දැ.ගැ.ස හා අ.ක.ස.

02.ප්‍රාදේශීය ලේකම් .................................. - කරු, දැ.ගැ.ස හා අ.ක.ස.

03.සියලුම අධ්‍යක්ෂවරුන් - කරු, දැ.ගැ.ස හා අ.ක.ස.
( දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව)